# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/78 – 2018 ජූලි 13 වැනි සිකුරාදා – 2018.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 62 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2016/යූඩීජ්/341.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කඩු/අත්/135/යූඩීජ්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 අප්‍රේල් මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර''
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, කඩුවෙල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 477ඒ, තලංගම උතුර බී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලංගම උතුර (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක සීඕ/කේඩීඞබ්ලිව්/2017/38 හා 2017.11.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අංක 1 – දොඹගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.3717**
උතුරට: කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හිමිකම් කියන දොඹගහවත්ත, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හිමිකම් කියන දොඹගහවත්ත සහ එස් සහ ජී දේපල සංවර්ධනකරුවන් හිමිකම් කියන දොඹගහවත්ත; නැගෙනහිරට: මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හිමිකම් කියන දොඹගහවත්ත සහ එස් සහ ජී දේපල සංවර්ධනකරුවන් හිමිකම් කියන දොඹගහවත්ත; දකුණට: උඩවත්ත පාර; බටහිරට: උඩවත්ත පාර සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හිමිකම් කියන දොඹගහවත්ත.

07 - 960